www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා හමුදාව අවසාන එල්ටීටීඊ නගරය අල්ලා ගනී

## Sri Lankan military captures last LTTE town

**2009 අප්‍රේල් 07**
**කේ. රත්නායක විසිනි**

දෙමල බෙදුම්වාදී එල්ටීටීඊ පාලනයේ පැවති අවසන් නගරය වූ පුදුකුඩිඉරුප්පු අල්ලා ගත් බව, අප්‍රේල් 5 දින හමුදාව නිවේදනය කලේය. එය එල්ටීටීඊය මිලිටරිමය වශයෙන් බිඳ වැටීමේ අද්දරට ගෙන ආ පරාජයන් මාලාවක මෑත ම සටන විය. ඉතිරි වී සිටින එල්ටීටීඊ සටන්කරුවන් තව මත් ඔවුන්ගේ පාලනය යටතේ පවතින වර්ග කිලෝමීටර් 17 තරම් වන, ආන්ඩුව ප්‍රකාශයට පත්කල යුද මුක්ත කලාපය ලෙස සැලකෙන වෙරලබඩ කුඩා බිම් තීරුවකට කොටුවී සිටිති.

ආන්ඩුවේ කියාපෑම් කෙසේ වෙතත් ඊට පටහැනි ලෙස නිරන්තරයෙන් හමුදාවේ කාලතුවක්කු ප්‍රහාරයන්ට ගොදුරු වන මෙම ප්‍රදේශය තුල අනාථ සිවිල් වැසියන් දස දහස් ගනනනක් ද කොටුවී සිටිති. උග්‍ර ආහාර, බෙහෙත් හා නවාතැන් හිඟයෙන් පෙලෙන "යුද මුක්ත" කලාපය තුල තත්වය අතිශයින් ඛේදනීයයි. හමුදාව අවසර දී ඇත්තේ ඉතා සීමිත සහන සැපයුම්වලට පමනි.

ජනාධිපති මහින්ද රාජපක්ෂ දැන් දිග හැරෙමින් ඇති මානුෂීය ව්‍යසනය පිලිබඳ සියලු ප්‍රවෘති වාරනය හා යටගැසීමේ උත්සාහයක නිරතව සිටියි. ආන්ඩුව ස්වාධීන මාධ්‍යවේදීන්ටත්, ආධාර හා මානව අයිතීන් පිලිබඳ සංවිධානවලටත් ප්‍රදේශය තුලට ඇතුල්වීම තහනම් කර ඇත. ගැටුම් හේතුවෙන් කොටුවී සිටින සිවිල් වැසියන්ගේ සංඛ්‍යාව දෙලක්ෂයක් පමන යයි තක්සේරු කරන ජාත්‍යන්තර ආධාර සංවිධාන පිලිබඳව ආන්ඩුවේ ප්‍රකාශකයෝ අවඥා සහගතව අදහස් පලකරති.

කෙසේ වුව ද එක්සත් ජාතීන්ගේ මානුෂික ආධාර පිලිබඳ ඉහල නිලධාරියෙකු වන ජෝන් හෝල්ම්ස් දිගට ම අවධාරනය කරන්නේ සටන්වලට කොටුවී සිටින සිවිල් වැසියන් සංඛ්‍යාව 150,000-190,000 අතර වන බවයි. මාධ්‍ය ආයතන ගනනාවක් වෙත කාන්දු වූ එක්සත් ජාතීන්ගේ අභ්‍යන්තර වාර්තාවකට අනුව වන්නි ප්‍රදේශය තුල ජනවාරි 20 හා මාර්තු 7 අතර කාලය තුල වාර්තාගත අවම මරන සංඛ්‍යාව 2683 හා තුවාලකරුවන් 7841 යයි සඳහන් කෙරේ. ඉන් පෙන්නුම් කෙරෙන්නේ සතියකට පුද්ගල මරන 400 හා තුවාල සිදුවීම් 1000 සිදුවන බවයි. "සෑම දිනක ම මරනයට පත්වන පුද්ගල සංඛ්‍යාව මසක් තුල දෙගුන වී ඇතැයි" ප්‍රසිද්ධ නොකල වාර්තාවකින් කියා සිටියි.

නිසැකව ම සිවිල් වැසියන්ගේ මරනවලින් බෙහොමයක් සිදුව ඇත්තේ ඉතා ඉහල අවි බලයක් දරාසිටින රජයේ හමුදා අතිනි. 2002 සටන් විරාමය උල්ලංගනය කරමින්, 2006 ජූලි මාසයේ රාජපක්ෂ ආන්ඩුව යුද්ධය යලි ඇරඹූ තැන් පටන් ප්‍රදේශ වාසීන් පාගා ත්‍රස්ත කිරීමේ උපායක් ලෙස ජනාශ්‍රිත ප්‍රදේශවලට හමුදාව යලි යලිත් බෝම්බ හෙලා ඇත.

පුදුකුඩිඉරිප්පු අල්ලා ගැනීමේ සටන, ආන්ඩුව හා හමුදාව කලින් බලාපොරොත්තු වූවාට වඩා බෙහෙවින් දිග් ගැස්සී ඇත. හමුදා ආරංචි මාර්ගවලට අනුව ප්‍රහාරය සඳහා 12,000 හමුදාවක් යොදවා ඇති අතර එල්ටීටීඊ පලායාම වැලැක්වීම සඳහා තවත් 40,000 හමුදා භටයන් ප්‍රදේශය වටලාගෙන සිටියි. එහෙත් දැඩි එල්ටීටීඊ ප්‍රතිරෝධයකට හමුදාව මුහුනදී සිටින තතු හමුවේ දින ගනනකින් අවසන් වීම කෙසේ වෙතත් මෙහෙයුම මාසයකටත් වැඩි කාලයක් ඇදී ගොස් තිබේ.

පුදුකුඩිඉරුප්පු අල්ලා ගැනීමට පෙර තෙදින තුල හමුදාව, එල්ටීටීඊ සාමාජිකයන් 420 මරාදැමූ බව ආරක්ෂක අමාත්‍යාංශය කියා සිටියි. තීපන්, ගඩාෆි හා විදූෂා යන අය ද ඇතුලත් ජ්‍යෙෂ්ඨ එල්ටීටීඊ මිලිටරි නායකයන් සය දෙනෙකු මියගිය අය අතර සිටින බව ද කියැවේ.

"ආරක්ෂක හේතුන්" මත යයි පවසමින් මිලිටරිය තම සාමාජිකයන්ගේ මරන පිලිබඳ තොරතුරු හෙලි කිරීම පසුගිය ඔක්තෝබරයේ සිට නවතා දමා ඇත. සැබෑ හේතුව වන්නේ යුද්ධයට එරෙහි මහජන ප්‍රතිචාරය පිලිබඳව ආන්ඩුවේ වැඩෙන කනස්සල්ලයි. තුවාල ලත් හමුදා භටයන් කොලඹ හා අවට රෝහල් කරා නොකඩවා රැගෙන එයි. හමුදා සෙබලෙකුගේ මරනය සලකුනු කෙරෙන සුදු කොඩි, පිරිසර බද ගම් හා නගරවල පොදු දසුනක් බවට පත්වෙමින් තිබේ. පසුගිය සතියේ දී ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කන්ඩායමක් දකුනේ ගම්වල අවමඟුල් ස්ථාන හතක දී සොවින් තැවෙන ඥාතීන් සමඟ කථාබස් කලහ.

ජනාධිපතිගේ සොහොයුරෙකු ද වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ 6 දින බීබීසී සේවය වෙත ප්‍රකාශ කලේ, හමුදාවට "ආරක්ෂක කලාපය තුලට ඉක්මනින්ම ඇතුල්වීමේ කිසිදු සැලැස්මක් නැත. අපගේ අරමුන සිවිල් වැසියන් යුද මුක්ත කලාපයෙන් ආරක්ෂිත ලෙස ඉවත්කර ගැනීමයි" යනුවෙනි. කෙසේ වුව ද වෙනම නිවේදනයක් මගින් ආරක්ෂක අමාත්‍යාංශය කියා සිටියේ "එල්ටීටීඊය මගින් ප්‍රානඇපකරුවන් ලෙස රඳවාගෙන සිටින සිය ගනනක් සිවිල් ජනතාව මුදාගැනීමේ තීරනාත්මක උපායික මෙහෙයුමක්" දියත්කර ඇති බවයි.

මෙම ප්‍රකාශ කිසිවක් කොටුවී සිටින සිවිල් වැසියන් කෙරෙහි කිසිදු අව්‍යාජ උත්සුකයකින් කෙරෙන්නේ නොවේ. ආන්ඩුව හා හමුදාව සියලු දෙමල වැසියන් සතුරන් ලෙස සලකමින්, පලායන සියලු දෙනා රැඳවුම් කඳවුරු තුලට ගාල් කරති. එසේ පලවන උත්සුකයන්ගේ මූලික අරමුන සටන් විරාමයක් සඳහා වැඩි වැඩියෙන් කෙරෙන ජාත්‍යන්තර ඉල්ලීම් වෙනතකට හැරවීමයි.

මාර්තු 26 දින එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලයේ සාකච්ඡාවෙන් පසුව සිවිල් ජනතාව ඉවත් කිරීමට ඉඩ සැලසෙන පරිදි "මානුෂික විරාමයක්" සඳහා එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍ය ඒකාබද්ධ කැඳවුමක් නිකුත් කලේය. කෙසේ වුව ද ශ්‍රී ලංකාවේ ආන්ඩුව මෙන්ම බලවතුන් දෙදෙනා ද උනන්දු වන්නේ ජනතාව මුහුන දී සිටින පීඩාව පිලිබඳව නොවේ. දෙරට ම රාජක්ෂ ආන්ඩුව යලි ඇරඹූ යුද්ධයටත් ප්‍රජාතන්ත්‍රීය අයිතීන් උල්ලංගනය කිරීමටත් එකහෙලා සහයෝගය දුන්හ.

එල්ටීටීඊය මිලිටරිමය වශයෙන් බිඳ වැටීමේ තත්වය හමුවේ වොෂින්ටනය කනස්සල්ලට පත්ව ඇත්තේ ආන්ඩුවේ ලේ වැගිරීම් හා දෙමල සුලුතරයේ අයිතීන් අමුඅමුවේ පාගා මැඩීම මගින් ශ්‍රී ලංකාව තුල මෙන්ම අසල්වාසී ඉන්දියාව තුලත් දේශපාලන අස්ථාවරත්වය තවදුරටත් උග්‍ර අතට හැරේය යන කාරනය ගැන පමනි. පසුගිය දශකය පුරා එක්සත් ජනපදය ඉන්දියාව සමග සමීප ආර්ථික හා මූලෝපායික සබඳතා ගොඩනගාගෙන ඇත. දකුනු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තය තුල යුද්ධය පිලිබඳව මහජන විරෝධය වැඩී ඒම කෙරෙහි කනස්සල්ලට පත්ව සිටින ඉන්දියාව සටන් විරාමයක් කැඳවුම් කරයි.

කුමන සටන් විරාමයක් හෝ නතර කිරීමක්, කෙලින්ම බැහැර කරන ජනාධිපති රාජපක්ෂ 5 ඉරිදා කොන්දේසි විරහිත යටත්වීමක් සඳහා වන සිය ඉල්ලීම යලි අවධාරනය කලේය. යුද්ධයේ අන්තවාදී ආධාරකරුවන් දැන් ''ජාත්‍යන්තර කුමන්ත්‍රනයක්'' පිලිබඳව කෑකොස්සන් ගසන නමුදු කෙසේ හෝ සිය ජාත්‍යන්තර සගයන් සමීපව තබාගැනීමේ අවශ්‍යතාවය ආන්ඩුව හොඳින්ම වටහාගෙන සිටියි. කිසිදු ප්‍රධාන බලවතෙකු එල්ටීටීඊ සමඟ සාකච්ඡාවන්ට හෝ ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියාවලියට යලි එලඹෙන ලෙස කියා නොසිටියි.

වාර්ගික ආතතීන් උත්සන්න කිරීම සඳහා පලාත් සභා මැතිවරන ව්‍යාපාරය තුල දී යුද්ධය යොදාගැනීමට රාජපක්ෂ උත්සාහ දරයි. ඔහුගේ ආන්ඩුවට එරෙහි ඡන්දයක ඇඟවීම් පිලිබඳව පැහැදිලිව ම උත්සුක වන ජනාධිපති මෙසේ ප්‍රකාශ කලේය. "ඔබ වැරදි තීන්දුවක් ගතහොත් ජාත්‍යන්තර ප්‍රජාව, ආන්ඩුව ජනතාවගේ අනුමැතියකින් තොර යුද්ධයක යෙදී සිටින බව සිතනු ඇත."

එල්ටීටීඊය ද රාජපක්ෂ යලි ඇරඹූ යුද්ධයට පිටුබලය දුන් එම "ජාත්‍යන්තර ප්‍රජාවට ම" යලි යලිත් ඇරයුම් කරමින් සිටියි. අභාවයට පත් සාම ක්‍රියාදාමයේ හිටපු නෝර්වීජියානු විශේෂ නියෝජිත එරික් සෝල්හයිම්ට එල්ටීටීඊ දේශපාලන ප්‍රකාශක බී නඩේසන් මෑතකදී දුරකථන ඇමතුමක් ලබාදුන් බව සන්ඩේ ටයිම්ස් පත්‍රය වාර්තා කලේය. නඩේසන් මෙසේ ප්‍රකාශ කල බව වාර්තා විය. "දැන් ඉහල ම ප්‍රමුඛත්වය ලැබිය යුත්තේ ශ්‍රී ලංකා හමුදාවන් විසින් කර ගෙන යනු ලබන ජනඝාතනය නතර කරනු සඳහා වහාම සටන් විරාමයක් ඇති කිරීමටයි."

1970 ගනන්වල එල්ටීටීඊ පිහිටවූ තැන් පටන් දිවයිනේ උතුරු හා නැගෙනහිර වෙන ම දෙමල රාජ්‍යයක් සඳහා වන එහි ඉදිරිදර්ශනය සෑම විටම පදනම්වූයේ එක් හෝ වැඩි ගනනක් මහා බලවතුන්ගේ පිටුබලය ලබා ගැනීම මතය. මෙම බෙදුම්වාදී ක්‍රියාමාර්ගය නියෝජනය කලේ දෙමල ධනේශ්වරයේ මිස දෙමල කම්කරුවන්ගේ හා ගොවීන්ගේ අවශ්‍යතාවන් නොවේ. ආරක්ෂාව පතා යුද කලාපයෙන් පලායාමට දෙමල ජනතාවට ඉඩදීම ප්‍රතික්ෂේප කිරීම මගින් එල්ටීටීඊය සාමාන්‍ය වැඩ කරන ජනතාව කෙරෙහි සිය පසමිතුරුබව පෙන්නුම්කර තිබේ.

දෙමල ජනතාව අතර ද තමන් කබලෙන් ලිපට වැටෙනු ඇතැයි යන සාධාරන බියක් පවතියි. රාජපක්ෂ යෙදීගෙන සිටින්නේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක" නොව දශක ගනනාවක් තිස්සේ බලයට පත් සෑම කොලඹ අන්ඩුවක් අතින්ම දෙමල විරෝධී වෙනස්කම් කිරීම හා පෑගීමට ලක්වීමෙන් නිර්මානය වූ වාර්ගික ගැටුම පවත්වාගෙන යාමෙහිය. දිවයිනට "සාමය හා සහජීවනය" ගෙන එන්නේය යන ජනාධිපතිගේ කියාපෑමෙහි වංචනිකත්වය, ආන්ඩුවට ගැති කුප්‍රකට සන්නද්ධ කල්ලි ප්‍රධානියෙකු විසින් නායකත්වය උසුලන "මුදාගත් නැගෙනහිර" දැඩි මිලිටරි පාලනයක් යටතේ පැවතීමේ කාරනයෙන් මනාව පෙන්නුම් කරයි.

දැවැන්ත යුද වියදම් හා දැන් ගැඹුරු වන ගෝලීය ආර්ථික පසුබෑමේ කොන්දේසි මගින් ආන්ඩුව දරුනු ආර්ථික අර්බුදයකට ඇද දමා තිබේ. ගෙවුම් ශේෂයේ නොවැලැක්විය හැකි අර්බුදයකට මුහුනපා සිටින රාජපක්ෂට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඩොලර් බිලියන 1.9 නයක් ගැනීම කරා යොමුවීමට සිදුව තිබෙන අතර එය රටේ ඉතිහාසයේ දැවැන්තම නය බවට පත්වෙයි. අපකීර්තිමත් සීමා පැනවීමේ පියවර ගැනීමට තමන්ට බලකෙරී ඇතැයි යන්න ප්‍රතික්ෂේප කරන ගමන්ම රාජපක්ෂ ජාමූඅ සතුටු කිරීමේ වැඩවලට දැනටමත් අත ගසමින් සිටියි.

මැත සති තුල ආන්ඩුව අත්‍යාවශ්‍ය භාන්ඩ 10 බදු ඉහල නංවා, ආරක්ෂක හමුදාවන්ට හැර රාජ්‍ය අංශයට බඳවාගැනීම් අත්හිටුවා, විදුලි බලය පුද්ගලීකරනයට ඉඩ සැලසෙන නීති සම්මත කර, රාජ්‍ය සේවයේ කම්කරුවන් දොට්ට දැමීමට මඟ පාදන පියවර හා වැටුප් කැටිකිරීමක් නිවේදනය කර ඇත. අප්‍රේල් 25 දින පලාත් සභා මැතිවරනයෙන් පසුව තවත් සීමා පැනවීම් සිදුවනු ඇති බවට පලවන වාර්තාවලින් කොලඹ ජනමාධ්‍ය පිරී පවතියි.

සති අන්ත සන්ඩේ ටයිම්ස් පත්‍රයේ දේශපාලන තීරු කතුවරයා ප්‍රකාශ කර ඇත්තේ එල්ටීටීඊ එරෙහි යුද්ධයේ නිමාව නව "ආර්ථික යුද්ධයක" ආරම්භය සලකුනු කිරීමක් පමනක් වනු ඇති බවයි. "එල්ටීටීඊ එරෙහි සටන සමඟ සසඳන කල එල්බී තිබෙන ආර්ථික යුද්ධයට අත ගැසීම රාජපක්ෂට ඊටත් වැඩි බියකරු කර්තව්‍යයක් වනු ඇතැයි" ඔහු අනතුරු අඟවයි. ලියුම්කරු මින් අදහස් කරන්නේ කුමක් දැයි සඳහන් කර නැති නමුදු එම තීරුව පිලිබිඹු කරන්නේ ආර්ථික අර්බුදය සමාජ පිපිරීමක් සඳහා වේදිකාව සකසනු ඇතැයි යන්න පිලිබඳව පාලක කවයන් තුල පවතින භීතියයි.

එම ප්‍රකාශය ලංකාවේ කම්කරුවන් මුහුන දෙන අන්තරායන් සලකුනු කරයි. එල්ටීටීඊ පරාජය සාමය හා සමෘද්ධිය ලඟා කර දීම කෙසේ වෙතත් දැනටමත් යුද්ධයේ බරට කරගැසීමට සිදුව ඇති කම්කරු පන්තියේ සමාජ කොන්දේසි මත දුර දිග යන ප්‍රහාරයකට ආන්ඩුව සූදානම් වෙමින් සිටියි. "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" වහන්තරාව යටතේ 25 වසරක් පුරා ගොඩනගාගෙන තිබෙන පොලිස්-රාජ්‍ය යාන්ත්‍රනය දැන් කම්කරු පන්තියෙන් එල්ල වන ප්‍රතිරෝධය හා විරෝධය පොඩිපට්ටම් කර දැමීම සඳහා යොදාගන්නවා ඇත.

© www.wsws.org